රාජ්‍ය සේවා කොමිෂන් සභාව

<u>වෙළෙඳ,වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය</u>

<u>වාණිජ දෙපාර්තමේන්තුවේ අතිරේක වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ පුරප්පාඩු පිරවීම</u>

වාණිජ දෙපාර්තමේන්තුවේ අතිරේක වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි (ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණය) පවතින පුරප්පාඩු 01 ක් පිරවීම සඳහා මෙහි පහත 04 වගන්තියේ සඳහන් සුදුසුකම් ඇතුළු අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර ඇති වාණිජ දෙපාර්තමේන්තුවේ සක්‍රිය සේවයේ නිරත විධායක සේවා ගණයේ පළමු ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් භාර ගනු ලබන අවසාන දිනය 2026.07.09 දින වේ.

**1. බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලබන අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

**2. බඳවා ගැනීමේ සුදුසුකම්:**

**(අ) අධ්‍යාපන සුදුසුකම්:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ආර්ථික විද්‍යාව/ආර්ථික මිතිය/ මූල්‍ය ආර්ථික විද්‍යාව/ සංවර්ධන ආර්ථික විද්‍යාව/ සංවර්ධන සහයෝගීතාවය, ජාත්‍යන්තර වෙළෙඳාම, වාණිජ/ මූල්‍ය කළමණාකරණය, සංඛ්‍යානය, ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය පරිපාලනය/ අළෙවිකරණය, වාණිජ හෝ ජාත්‍යන්තර වෙළෙඳ නීති, ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**(ආ) පළපුරුද්ද:**

i. උසස් වීම සඳහා සුදුසුකම් ලබන දිනට වාණිජ දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ දෙපාර්තමේන්තුගත තනතුරක/ තනතුරුවල වසර 18 කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ii. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට වාණිජ දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ දෙපාර්තමේන්තුගත තනතුරක/ තනතුරුවල පළමු ශ්‍රේණියේ වසර 5ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක 5 ක් උපයාගෙන තිබීම.

**(ඇ) කායික සුදුසුකම්:**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**(ඉ) වෙනත් සුදුසුකම්:**

i. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

ii. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන් හා ඊට සිදු කරනු ලැබූ සංශෝධනයන්ට අනුකූලව පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

iii. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, පූර්වාසන්න වසර 05 තුල වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

iv. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් හා කොන්දේසි සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. **වයස් සීමාව:** අදාල නොවේ.

4. **පත්වීම ක්‍රියාත්මක වන දිනය :**
තනතුරේ වැඩ බාරගන්නා දිනයේ සිට පත්වීම ක්‍රියාත්මක වේ.

5. **යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:**
යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | ලකුණු | ප්‍රධාන ශීර්ෂය යටතේ උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **1.0 අතිරේක සේවා පළපුරුද්ද**<br><br>විධායක සේවා ශ්‍රේණියේ 1 ශ්‍රේණියේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු එළඹෙන අමතර සේවා කාලය සඳහා ලකුණු ලබා දීමේ දී,<br><br>➢ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා සඳහා උපරිම ලකුණු ප්‍රමාණය ලබා දෙනු ලැබේ.<br><br>අනෙකුත් නිලධාරීන් සඳහා ජෙෂ්ඨතාවය = <u>ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු</u> x අදාල නිලධාරියාගේ අමතර සේවා කාලය (අවුරුදු x 12 + මාස)<br>ජ්‍යෙෂ්ඨතම නිලධාරියාගේ අමතර සේවා කාලය (අවුරුදු x 12 + මාස) | 40 | 40 |
| **2.0 අමතර අධ්‍යාපන සුදුසුකම්**<br><br>ඉහත 4 (අ) ඡේදයේ සඳහන් ක්ෂේත්‍රයක | | 10 |
| 2.1 දර්ශනශූරී උපාධිය | 06 | |
| 2.2 පශ්චාත් උපාධිය | 05 | |

| | | |
|---|---|---|
| 2.3 පශ්චාත් උපාධි ඩිප්ලෝමාව<br><br>2.4 ඉහත 4 (අ) ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ පසු දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය මත සාර්ථකව සම්පූර්ණ කළ පුහුණුවීම්, පර්යේෂණ හෝ වෙනත් විශේෂ පැවරුම් - එකකට ලකුණු 02 බැගින් | 04<br><br>04<br>(උපරිම) | |

සටහන I: ඉහත පශ්චාත් උපාධි සුදුසුකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගෙන තිබිය යුතු වන අතර අනෙකුත් පුහුණුවීම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් හෝ රජය පිළිගත් විදේශ / බහුපාර්ශවීය පුහුණු ආයතනයකින් ලබා ගෙන තිබිය යුතුය.

සටහන II: ඉහත 2.1,2.2 හා 2.3 සුදුසුකම්වලින් ඉහළම සුදුසුකමට පමණක් ලකුණු පිරිනැමෙනු ඇත.

සටහන III: අපේක්ෂකයෙකු විසින් සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේදී අදාල සහතික පත්‍ර හා ලේඛන ඉදිරිපත් කල යුතු අතර එම සියලු ලේඛන/ සහතික පත්‍ර සෑම ආකාරයෙන්ම වලංගු විය යුතුය. නිසි බලධාරියාගේ ආවරණ අනුමැතියට යටත්ව ඉදිරිපත් කරනු ලබන කිසිදු ලේඛනයක්/ සහතික පත්‍රයක් වලංගු නොවේ

සටහන IV: සම්මුඛ පරීක්ෂණයට කැඳවීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

6. **අයදුම්පත් ඉදිරිපත් කිරීම:**

i. මෙම නිවේදනය සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියෙහි දෙපැත්තෙම භාවිතා කරමින් සෙ.මී. 22 – 29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස්කර සම්පූර්ණ කල අයදුම්පත් අයදුම්කරුවන් විසින් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ ඊට පෙර,

ලේකම්,
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය,
අංක 492, 2 වන මහල,
එල්.එච්.පී. ගොඩනැගිල්ල,
ආර්.ඒ.ද මෙල් මාවත,
කොළඹ 03.

සහ

විද්‍යුත් තැපැල් ලිපිනය : ministryoftradedevelopment@gmail.com

වෙත ලැබීමට සැලැස්විය යුතුය.

ii. අයදුම්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි "වාණිජ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයේ පුරප්පාඩුව පවතින අතිරේක වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම (සීමිත) 2026" යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය.

iii. අයදුම්පත්‍රය ලද බව දන්වනු නොලැබේ.

iv. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප විය හැක.

v. අයදුම්පත්‍රයට කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

vi. අයදුම්පත්‍රයක් හෝ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි පිළිබඳ සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරු විසින්ම විඳදරා ගත යුතුය.

**7.** සාවද්‍ය තොරතුරු සැපයීම

අයදුම්කරු විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් එවැනි අයදුම්කරුවෙකුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලබන අතර එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් පත්වීමෙන් පසුව අනාවරණය වුවහොත් පත්වීම්ලාභියා තනතුරින් පහ කරනු ලැබේ. ඉහත අවස්ථා දෙකෙහිදීම, අයදුම්කරු අදාළ වරද සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබීමකටද යටත් වනු ඇත.

**8.** පවතින සේවා අවශ්‍යතාව අනුව මෙම පුරප්පාඩුව නොපුරවා තැබීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**9.** මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

**10.** අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සමාන ලකුණු ලබා ඇති අවස්ථාවක් ඇතුළුව මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

.......................................

ලේකම්,
වෙළෙඳ, වාණිජ ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය.
2026.06. 24

කේ.ඒ. විමලේන්තිරරාජා
ලේකම්
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03.